# බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අපේ විරුද්ධතාව

මා බලාපොරොත්තු වූ පරිදි ම කලින් දිනක මා විසින් සඳහන් කරනු ලැබූ සතිඅන්ත කසිකබල් පුවත්පතේ කතුවරයා මා මේ තීරුවේ දැක් වූ අදහසකට විරුද්ධව හැල්ලක් ලියා ඇත. මෙකල පුවත්පත් කතුවරයකු වීම සඳහා භාෂාව පිළිබඳ අවබෝධයක් හෝ න්‍යාය හා තර්කණය පිළිබඳව හෝ වෙනත් යමක් ගැන හෝ එතරම් දැනුමක් අවශ්‍ය නො වේ. (සියළු පුවත්පත් කතුවරුන් එසේ යැයි මෙයින් නො කියැවෙයි.) ව්‍යාකරණ දෝෂ සහිතව නමුදු ඊනියා වාක්‍යයක් දෙකක් ගැටගසා ගැනීමට හැකිනම් හා දේශපාලන ඕපාදූප දැනගැනීමට හැකියාව ඇත්නම් ඒ ඊනියා කතුවරයා නිතර යොදාගන්නා වචනයක් පාවිච්චි කරන්නේ නම් බරපතළ දේශපාලන විග්‍රහ කරන කතුවරයකු විය හැකි ය. ඒ හැකියාව ප්‍රියාවට පරිවර්තනය කර පුවත්පතක් පවත්වාගෙන යැමට අවශ්‍යවන්නේ පුවත්පතේ අළෙවිය හෝ පාඨක පිරිසක් හෝ නො වේ. අදාළ කසිකබල් පුවත්පතට එතරම් අළෙවියක් හෝ පාඨක පිරිසක් හෝ නැත. මේ ඊනියා කතුවරුන්ට අවශ්‍ය වන්නේ පුවත්පත නඩත්තුකිරීම සඳහා යම් ආකාරයකට ප්‍රතිපාදන සපයන පුද්ගලයකු හෝ ආයතනයක් හෝ පමණකි.

ඒ පුවත්පතෙහි කතුවරයා කියා ඇති දේ ගැන සඳහන්කිරීමට පෙර තමිල්සෙල්වන්ට මෙළොව අත්හැර යැමට සැලැස්වීම පිළිබඳ ව ගුවන් හමුදාවට අපේ ප්‍රණාමය පළකළ යුතු ය. ගුවන් හමුදාව ඇතුළු ත්‍රිවිධ හමුදාවත් පොලීසියත් එහි විශේෂ කාර්ය බල සාධකයක් පසුගිය අවුරුදු දෙකක පමණ කාලයක ත්‍රස්තවාදය පරාජයකිරීම සඳහා කර ඇති කැපවීම ඉතා ප්‍රශංසනී ය. අද ලෝකයේ ත්‍රස්තවාදී ගජිල්ලා කණ්ඩායම්වලට එරෙහිව සටන්කළ හැකි හොඳම ආරක්ෂක භට හමුදා ඇත්තේ ලංකාවට යැයි කිව හැකි ය. කොටි ත්‍රස්තවාදීන් අද දිස්ත්‍රික්ක දෙකකට පමණක් කොටු වී ඇත. අපේ හමුදාවන්ට කොටි පැරදවීම දශක දෙකකට ඉහත දී කළ හැකිව තිබුණි. පළමුව ඉන්දියාවේ මැදිහත්වීමෙන් හා පසුව බටහිර රටවල බලපෑමෙන් ඒ නැති වී ගියේ ය. එයට හේතුව හමුදාවල වරදක් නොව අදීන දේශපාලන නායකත්වයක් නො තිබීම ය. එක්සත් ජාතින්ගේ සංවිධානයේ දී මෙන් ම මෙවර අයවැය යෝජනා ඉදිරිපත් කිරීමේ දී ද ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ත්‍රස්තවාදය මුළුමනින් ම පරාජය කිරීමේ වැදගත්කම අවධාරණය කෙළේ ය. අප ස්වෛරී රාජ්‍යයක් බව අමතක නොකරමින් කිසිදු බලපෑමකට යට නොවී කොටි පැරදවීම අධිෂ්ඨානශීලීව ඉදිරියට ගෙන යා යුතු ය.

මේ අතර තමිල්සෙල්වන්ගේ මරණය ගැන කම්පාවූවෝ ද වෙති. ඔවුන් අතර සොල්හයිම්, ඉන්දියාවේ කරුණානිධි හා දෙමළ ජාතික සංධානයේ නායකයෝ වූහ. එයට අමතර ව මුස්ලිම් කොංග්‍රසයේ රවුෆ් හකීම් මහතා ද විය. හකීම් මහතා අද මුස්ලිම් කොංග්‍රසය බටහිරයන්ගේ තුරුල්ලට රැගෙන ගොස් ඇත. බටහිරයන්ට එහෙයි කියන ලෝකයේ මුස්ලිම් නායකයන් කිහිප දෙනාට හකීම් මහතා ද අයත් වෙයි. නුස්ලිම් කොංග්‍රසය දෙමළ ජාතිවාදයට පක්ෂපාතී වන්නේ මූලික වශයෙන් ම මේ බටහිර ගැති බව නිසා ය. මුස්ලිම් කොංග්‍රසයට බටහිර රටවලින් ලැබෙන ආධාර ඒ බටහිර ගැතිබව සමග බැඳී ඇතැයි සිතිය හැකි ය. කොටි සංවිධානය තමිල්සෙල්වන්ගේ මරණයෙන් බටහිරයන්ගේ අනුකම්පාව දිනාගන්නට උත්සාහ ගන්නේ යැයි ඇතැම්හු කියති. එහෙත් මෙහි සත්‍යතාවක් නැත. සිදුවන්නේ බටහිරයන් තමිල්සෙල්වන්ග් මරණය ඊනියා සාමයට බාධාවක් බව තම ප්‍රවෘත්ති ජාල ඔස්සේ ලෝකයාට කීම ය. ඒ කොටින්ගේ වුමනාවට කෙරෙන්නක් නොව බටහිරයන්ගේ ම අවශ්‍යතාව පරිදි සිදු කරන්නකි. මෙහි දී බොහෝ දෙනා දැනටමත් සඳහන්කර ඇති ආකාරයට කිව යුත්තේ තමිල්සෙල්වන් කොටින්ගේ ඊනියා දේශපාලන නායකයා නොවන බව ය. කොටින්ට ඇත්තේ ත්‍රස්තවාදී දේශපාලනය පමණකි. ඒ දේශපාලනයේ ද නායකයා ප්‍රභාකරන් ය. ත්‍රස්තවාදී තමිල්සෙලාවන් බටහිර ලිය පිටපතකට සරිලන පඹිදි ව්‍යාජ දේශපාලන සාමයක් රඟපැවේ ය.

මෙරට බොහෝ අයට තවමත් බටහිරයන්ගේ විශේයෙන් ම බ්‍රිතානියේ ක්‍රියා කලාපය ගැන වැටහීමක් නැත. ඇතැමුන්ට අනුව මෙහි ඇත්තේ බටහිර කුමන්ත්‍රණයක් හා ඉන්දීය ප්‍රතිකුමන්ත්‍රණයක් ය. මේ කතාව දේශපාලන විග්‍රහයක් නොව කණාබල්ලන් ගැසීමකි. මෙරට ඇතැම් සිද්ධි බටහිර කුමන්ත්‍රණ, විශේෂයෙන් ම සී අයි ඒ කුමන්ත්‍රණ ලෙස විස්තර කළෝ පැරණි සමසමාජ පාක්ෂිකයෝ හා කොමියුනිස්ට් පාක්ෂිකයෝ ය. මේ කසිකබල් මාක්ස්වාදීහු තම ගුරුවරුන්ගේ එවැනි ම වූ කසිකබල් ප්‍රවාදවලින් සංසිද්ධි තේරුම්ගැනීමට නොහැකි වූ විට මේ කුමන්ත්‍රණ කතාව ඇද බැහ. ඒ කෝකටත් තෛලයක් විය. අද මේ කසිකබල් මාක්ස්වාදන් දෙමළ ජාතිවාදය ද ඇතුළු බොහෝ

© Prof. Nalin De Silva

ප්‍රශ්නවල දී හන්නේ බටහිරයන්ගේ ස්ථාවරය ම ය. එසේ වී ඇත්තේ ද සී අයි ඒ කුමන්ත්‍රණයක් නිසා දැයි ඔවුහු නො කියති. එහෙත් ඔවුන් එසේ කරන්නේ ඇයි ද යන්න තේරුම් ගැනීම අපට ප්‍රශ්නයක් නො වේ. අපේ ප්‍රවාද ඔස්සේ අපට ඒ තේරුම් හත හැකි ය. ඇතැමුන් දෙමළ ජාතිවාදය පිටුපස බටහිර කුමන්ත්‍රණ හා ඉන්දීය ප්‍රතිකුමන්ත්‍රණ ගැන කීවේ කසිකබල් මාක්ස්වාදීන්ගේ ආභාසයෙන් කණාබල්ලන් ගැසීමෙන් මිස දේශපාලන විග්‍රහයක් ඇසුරෙන් නො වේ.

බටහිර අධ්‍යාපනය ලබා ඊනියා උගත්කමක් හෙවත් අනුකාරක මනසක් ලබාගත්තවුනට බටහිරයෝ ශාන්තුවරයෝ වෙති. මේ අනුකාරකයන්ට අනුව බටහිරයන් දෙමළ ජාතිවාදයට ආධාර කරන්නේ දෙමළ ජනයාට සිංහලයන්ගෙන් අසාධාරණයක් සිදු වී ඇතැයි ඔවුන් විශ්වාස කරන බැවිනි. මේ ඊනියා උගතුන් කියන්නේ බටහිරයන් එසේ විශ්වාස කරන්නේ දෙමළ නායකයන්ගේ ප්‍රචාරවලට රැවටීමත් ඒ ප්‍රචාරවල අසත්‍යබව හෙළිදරවු කිරීමට ඒ ඒ රටවල ලංකාවේ තානාපති කාර්යාල කිසිවක් නොකිරීමත් නිසා ය. බටහිර රටවල ප්‍රචාරය දෙන්නේ ඔවුන්ට අවශ්‍ය මතයක් තහවුරුකිරීමට ය. දෙමළ ජාතිවාදී මතයට බටහිර එතරම් ප්‍රචාරයක් ලැබෙන්නේ ඒ මතය බටහිරයන්ගේ ම නිර්මාණයක් වන බැවිනි. බටහිර රටවල ලංකාවේ තානාපති කාර්යාලවලින් එතරම් වැඩක් නොවන බව පැහැදිලි ය. ඕනෑම සුළු කරුණකට පවා ඇමතිවරුන් බටහිර රටවලට යන්නේ ද ඒ නිසා විය හැකි ය. ඒ කෙසේ වෙතත් ලංකාවේ තානාපති කාර්යාලවලට දෙමළ ජාතිවාදය සම්බන්ධයෙන් බටහිර රටවල දෙමළ ජාතිවාදයට විරුද්ධ වූ මතයක් ඇතිකිරීමට ඇති ඉඩකඩ ඉතා සීමාසහිත ය. මුළු මහත් දෙමළ ජාතිවාදය ම බිහිකෙරුනේත් දැනට නඩත්තු කෙරෙන්නේත් ප්‍රධාන වශයෙන් ම බටහිරයන් විසිනි. ඒ පසුපස ඇත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ය. සියවස් පහකට පමණ පෙර ඇති වූ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ න්‍යාය පත්‍රයෙහි ඇත්තේ ප්‍රධාන වශයෙන් ම එක් කරුණකි. ඒ තම සංස්කෘතිය, ආර්ථිකය හා දේශපාලනය (අවශ්‍ය ව්‍යුහ ද සහිත ව) මුළු ලෝකය පුරා බලයෙන් හෝ උපක්‍රමයෙන් හෝ ප්‍රචලිත කිරීමත් තහවුරු කිරීමත් ය. වෙනත් වචනවලින් කියන්නේ නම් බටහිරයෝ මුළු ලෝකය ම තම සංස්කෘතික, ආර්ථික හා දේශපාලනික ආධිපත්‍යය යටතට ගැනීමේ උත්සාහයක දිගින් දිගට ම යෙදී සිටිති. අපි මෙයට බටහිර ක්‍රිස්තියානි නූතනත්ව යටත්විජිතවාදය යැයි කියමු. ලංකාවේ බටහිර ක්‍රිස්තියානි නූතනත්ව යටත්විජිතවාදයට එරෙහි ප්‍රධාන ම බලකාය වනුයේ සිංහල බෞද්ධ ජනතාව ය. ඒ මිස ඊනියා කම්කරු පංතියක් නො වේ. අවුරුදු සීයක් පමණ මෙරට කම්කරු සටන් තිබූ බව අපි දනිමු. එහෙත් මේ සටන් යටත්විජිත විරෝධී සටන් නොව වෘත්තීය සමිති සටන් විය. ජනතා විමුක්ති පෙරමුණ විසින් මේ සටන් එක් කලක දී හඳුන්වනු ලැබුයේ කැඳ කෝප්ප සටන් ලෙස ය. එහෙත් ඔවුන් ද ඇතැම් අවස්ථාවල එවැනි සටන්වල යෙදෙනු දක්නට හැකි ය. එසේ සටන්කිරීම මුළුමනින් ම බැහැර කළ යුතු යැයි මෙයින් නො කියැවෙයි. එහෙත් ඒ සටන් යටත්විජිත විරෝධී සටන් නො වෙයි. ගෝවින්දන්ලා, කන්දසාමිලා හා සෝමපාලලා ඝාතනය කරනු ලැබුයේ යටත්විජිත විරෝධී සටන් කළ නිසා නො වේ. වතු ආර්ථිකය වෙනස්කිරීමට ගෝවින්දන් හෝ වෙනත් අයකු හෝ කළ සටනක් නැත. මේ සටන් යටත්විජිත විරෝධී සටන් නම් දැනට අවුරුදු පහළොවකට පමණ පෙර මෙරට විශ්වවිද්‍යාල ආචාර්යවරුන් දීර්ඝ කාලයක් වැඩ වර්ජනයේ යෙදීම ද යටත්විජිත විරෝධී සටනක් විය යුතු ය. මා ඉතා හොඳින් දන්නා ඒ වැඩ වර්ජනයේ දී විශ්වවිද්‍යාලවල දෙන විජාතික යටත්විජිතවාදී අධ්‍යාපනය වෙනස් කළ යුතු යැයි කියැවෙන ඉල්ලීමක් නො වී ය.

අර පුවත්පත් කතුවරයාට අනුව 1848 ට පසුව සිංහලයන් කළ යටත්විජිත විරෝධී සටනක් නැත. ඒ ඔහුගේ දැනුම ය. බ්‍රිතාන්‍යයින්ගේ පොතෙන් ඉතිහාසය ඉගෙන ගන්නවුන්ට එලෙස පෙනී යැම පුදුමයක් නො වෙයි. සිංහලයන් විශේෂයෙන් ම සිංහල බෞද්ධයන් බටහිර ක්‍රිස්තියානි නූතනත්ව යටත්විජිතවාදයට එරෙහිව සටන් නොකරන්නේ නම් එසේ සටන්කරන වෙනත් කිසිවෙක් නො වෙති. බ්‍රිතාන්‍යයින් තම පෙතේ සඳහන් නොකළත් මේ කරුණ බ්‍රිතාන්‍යයෝ මැනවින් දනිති. 1848 සිංහලයන් බටහිර ක්‍රිස්තියානි නඋතනත්ව යටත්විජිතවාදයේ දේශපාලන සංරචකයට එරෙහිව කළ අවසන් මහා සටන විය. ඉන් පසු ඇරඹුණේ එහි සංස්කෘතික සංරචකයට එරෙහිව කළ සටන් ය. පංච මහා වාද යනු හුදු ආගමික වාද නො වී ය. සිංහලයන්ගේ තරම හොඳින් දැන සිටි බ්‍රිතාන්‍යයෝ සිංහලයන්ට විරුද්ධව ලන්දේසීන් ගෙන ආ දෙමළ ජාතිවාදයට නව ජීවනයක් ලබා දුන්හ. අද දෙමළ ජාතිවාදයත් කොටි සංවිධානයත් බටහිරයන්ගේ අතකොළු පමණකි.

(මතු සම්බන්ධයි)

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva